ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1934/39 - 2015 ඔක්තෝබර් මස 02 වැනි සිකුරාදා - 2015.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩු පිරවීම

සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකුගේ මන්ත්‍රී ධුරය අහෝසි වීම හේතු කොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත් කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස බාසූරියගේ ආරියවංශ මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, බාසූරියගේ ආරියවංශ මහතා එම පුරප්පාඩුව සිදු වූ රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 ඔක්තෝබර් මස 01 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී ය.

10 - 718

1A - G 22410 — 46 (2015/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

### උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩු පිරවීම

උතුරු මැද පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් සඳහා තේරී පත්වීම හේතු කොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(1) වැනි වගන්තිය යටතේ උතුරු මැද පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද ;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත් කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65(2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස අනුරාධනායක කේ. මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද ;

මැතිවරණ කොමසාරිස් වඩුගේ වරුණසිරි මහින්ද දේශප්‍රිය වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අනුරාධනායක කේ. මහතා එම පුරප්පාඩුව සිදු වූ අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වී ඇති බව මෙයින් දන් ප්‍රකාශ කරමි.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2015 ඔක්තෝබර් මස 01 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ දී ය.

10 - 719

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.